**තලාව ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තලාව ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළව මුදලින් ලද ස්ථාවර තැන්පත් පොලිය රු.3,251,873 ක් වුවත් එය රු.3,317,248 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදලින් ලැබු පොලී සහ ලැබිය යුතු පොලිය වෙනස හේතු වන බව. | මුදලින් ලැබීම් පමණක් මුදල් ගලා ඒම ලෙස සැලකිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ රු.15,029,343 ක දේපල, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන සහ දේපල, පිරියත, උපකරණ නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ නිමකළ පෙට්ටි කඩ 24 ක රු.4,617,600 ක වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | එප්පාවල ආදාහනාගාරය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දරා තිබුණු රු.11,351,366 ක් ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගත යුතුය. |
| (ඉ) | LDSP ව්‍යාපෘතිය යටතේ පෙර පාසලක් ඉදිකිරීම සඳහා කළ ගෙවීම් රු.30,872,032 ක් සහ නළ ළිඳක් සඳහා වියදම් කළ රු.1,033,775 ක් දේපල, පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි අළුත්වැඩියා වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | LDSP ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ රු.1,922,679 ක් වියදම් කර තාප්පයක් ඉදිකිරීම දේපල, පිරියත සහ උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | | |
|---|---|---|
| (උ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට අතිරික්තයේ/ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය වූ රු.29,653,915 ක ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | -එම- | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළයුතුවේ. |
| (ඌ) කරගහවැව කසළ අංගනයේ වැඩ නියමිත පරිදි සිදුනොකිරීම නිසා මධ්‍යම පරිසර අධිකාරියට ගෙවිය යුතු රු.2,984,588 ක් ජංගම වගකීමක් ලෙස දක්වා නොතිබුණි. | -එම- | ජංගම වගකීම් නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උසාවි දඩ ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.19,907,494 ක් වුවත් හිඟ උසාවි දඩ ගිණුම අනුව එය රු.22,280,385 ක් වුයෙන් රු.2,572,891 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) මුද්දර ගාස්තු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.6,954,231 ක් වුවත් හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම අනුව එය රු.9,291,981 ක් වුයෙන් රු.2,337,750 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඇ) වර්ෂය ආරම්භයේ හා අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වෙනස්වීම් අනුව මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම රු.20,669,357 ක් වුවත් 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.30,706,675 ක් වුයෙන් රු.10,037,318 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඈ) 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව ශුද්ධ වත්කම් වටිනාකම රු.539,478,570 ක් වූ අතර හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය අනුව එය රු.539,526,304 ක් වුයෙන් රු.47,734 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.2,898,173 ක් වූ තොගයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති බවට වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණු නමුත් ගබඩා ලෙජර් ගිණුම් නිවැරදිව තුලනය කර නොතිබීම, නිකුත් කිරීම් දින අනුක්‍රමික ලෙස දක්වා නොතිබීම හා තොග සමීක්ෂණ වාර්තා නොතිබීම නිසා තොග ශේෂ නිවැරදි බවට තහවුරු කර ගැනීමට නොහැකි විය. | පිළිගන්නා බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ණයගැති හා ණයහිමි ලේඛන නඩත්තු කර නොතිබුණු අතර පෙර වර්ෂයේ ණයගැති ආරම්භගත ශේෂයට එකතු කර තිබුණු රු.21,722,252 ක ණය ශේෂය පිළිබඳව හා ණයහිමි ශේෂයට එකතු කර තිබුණු රු.35,519,348 ක් කුමක්ද යන්න පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අත්තිකාරම් කර්මාන්ත ගිණුම තුළ වූ රු.3,351,606 ක ආරම්භක ශේෂය කුමක්ද යන්න විස්තර ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ LDSP ව්‍යාපෘතිය යටතේ ඉදිකළ තඹුත්තේගම පෙර පාසල සඳහා ලබාදුන් රු.5,251,834 ක අත්තිකාරම් හා එය පියවීම පිළිබඳ ලෙජර ගිණුමේ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකරන ලද බෝක්කු සහ මංමාවත් පිළිබඳ විස්තර සමාලෝචිත වර්ෂයේ වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 571 | වටිනාකම රු.76,975 ක් වූ තැන්පත් ශේෂ 02 ක් නියාදනය කර නොතිබුණි. | පිළිගන්නා බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.11,591,445 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.14,234,885 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,100,493 | 14,183,776 | 14,662,751 | 22,331,932 | 13,206,476 | 14,561,565 | 9,636,543 | 22,810,907 |
| (ii) | කුලී | 21,132,744 | 13,622,075 | 14,677,552 | 5,450,457 | 21,734,898 | 18,270,589 | 12,681,752 | 6,505,934 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,221,400 | 4,230,756 | 4,657,114 | 649,150 | 4,503,150 | 5,216,434 | 4,192,326 | 1,075,508 |
| (iv) | වෙනත් ආදායම් | 25,743,850 | 28,774,180 | 19,138,164 | 17,894,350 | 19,082,253 | 19,260,705 | 37,938,419 | 8,258,334 |
| | | 64,198,487 | 60,810,787 | 53,135,581 | 46,325,889 | 58,526,777 | 57,309,293 | 64,449,040 | 38,650,683 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | 2009 වර්ෂය පදනම් කර ගනිමින් 2022 වර්ෂය සඳහා වරිපනම් තක්සේරු කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.19,919,623 ක් විය. | පිළිගන්නා බව. | අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | 2022 දෙසැම්බර් 31 දින වනවිට හිඟ ව්‍යාපාර බදු රු.606,000 ක් හා කර්මාන්ත බදු රු.26,250 ක් විය. | -එම- | -එම- |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභාවට අයත් ජල ව්‍යාපෘති 04 කින් අය විය යුතු හිඟ ශේෂය රු.780,059 ක් විය. | හිඟ ජල ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව. | -එම- |
| **(ආ)** | **කුලී** | | |
| | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.3,818,030 ක් සහ බදු දීම වෙනුවෙන් අය විය යුතු මුදල රු.3,311,279 ක් විය. | අදහස් දක්වා නැත. | -එම- |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු උසාවි දඩ රු.22,280,385 ක් හා මුද්දර ගාස්තු රු.9,291,981 ක් විය. | අයකර ගැනීමට කටයුතු කරන බව. | ගෙන්වා ගැනීමට කටයුතු සිදුකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1.1 අත්හැර දැමූ කර්තව්‍යන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කරගහවැව කොම්පෝස්ට් අංගනය ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියෙන් රු.5,760,735 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඒ අනුව 2012 ජනවාරි 27 දින ගිවිසුම්ගතවී මාස 06 ක කාලයක් තුළ එහි වැඩ අවසන් කළ යුතුව තිබුණි. අදියර 04 ක් යටතේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු මෙම ව්‍යාපෘතියේ පළමු අදියරයන්ට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණු අතර අනෙකුත් අදියරයන් සඳහා රු.1,077,389 ක වියදමක් සිදුකර එම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | කරගහවැව කොම්පෝස්ට් අංගනය පරීක්ෂා කර සුදුසු ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු කරන බව. | මෙම ස්ථානයේ තිබෙන වත්කම් ආරක්ෂා කර ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

### 3.1.2 ගව ඝාතකාගාර පවත්වාගෙන යාම

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තඹුත්තේගම සහ එප්පාවල යන ප්‍රදේශවල ගව මස් අලෙවිසැල් 02 ක් සහ ඌරු මස් අලෙවිසැල් 03 ක් වාර්ෂික බදුදීම් සිදුකර තිබුණු නමුත් එම මස්හල් සඳහා වන ගෝඝාතකාගාර පහසුකම් සභාව විසින් සම්පාදනය කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | ගෝඝාතකාගාර ආඥා පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 1988 අගෝස්තු 23 දිනැති අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ පරීක්ෂා කරනු ලබන සෑම මස් කිලෝ 01 ක් සඳහාම සභාවේ ලාංඡනය භාවිතා කිරීම වෙනුවෙන් රු.10 කට නොවැඩි ගාස්තුවක් අය කිරීමට හා ඝාතනය කරන සතුන්ගේ විස්තර අදාළ ආකෘතිය ප්‍රකාරව ලබාගැනීමටද සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරි කාලයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සභාපතිවරයා විසින් භාවිතා කරන ලද කැබ්රථය 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනයවී තිබුණු අතර ඒ සඳහා නියෝජිත ආයතනයෙන් | වාරික 02 ක් අයකර ගැනීමෙන් පසු රියදුරුගෙන් සියලු මුදල් අයකර අවසන් | සභාපතිගෙන් අයකර ගැනීම සඳහා නිත්‍යානුකූල කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (United Moters) ඉදිරිපත් කළ වාර්තාව අනුව අලාභය රු.3,400,520 කට ඇස්තමේන්තු කර තිබුණි. 2022 නොවැම්බර් 30 දින වනවිට මෙම වාහනය අළුත්වැඩියාව සඳහා වන වියදම රු.4,458,993 ක් දක්වා වැඩිවන බව එම නියෝජිත ආයතනය (United Moters) විසින් සභාව වෙත දන්වා තිබුණි. අනතුර සිදුවී වසර 03 කටත් වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් මෙම රථය අළුත්වැඩියා කිරීමට සහ රක්ෂණ වන්දි මුදල ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | වේ. සභාපතිගෙන් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල කටයුතු කරන බව. | |
| (ආ) | ඉහත අනතුරට අදාළ ඇස්තමේන්තු වටිනාකමෙන් සියයට 90 ක් වූ රු.4,013,094 ක් ප්‍රාදේශීය සභාවේ සභාපතිගෙන් සහ ඉතිරි සියයට 10 ක්වූ රු.445,899 ක් රියදුරුගෙන් අයකරගන්නා ලෙස නිර්දේශ ලබාදී තිබුණු නමුත් 2022 නොවැම්බර් 15 දින වනවිට රියදුරු විසින් රු.150,000 ක් පමණක් ගෙවා තිබුණු අතර සභාපති විසින් කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. | මූලික විමර්ශන වාර්තා ලැබීමෙන් පසු අවශ්‍ය කටයුතු කරන බව. | සභාපතිගෙන්අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | එප්පාවල උප කාර්යාලයේ සේවය කර මිය ගිය ආදායම් පරීක්ෂකවරයෙක් විසින් 2021 වර්ෂයේ ක්ෂේත්‍රයේදී එකතු කරන ලද රු.667,075 ක් ප්‍රාදේශීය සභාවට ලබාදී නොතිබීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| (ඈ) | LDSP ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති තලාව දුම්රිය පල මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ අත්තිකාරම් එම ව්‍යාපෘතිය ඉටුනොකර අතහැර දැමීම නිසා බැදුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු නොකිරීම නිසා හිටපු ලේකම්වරයෙකු වෙතින් අයවිය යුතු රු.1,826,330 ක අධිභාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළින් හෙළිදරව් කර නොතිබුණි. | -එම- | -එම- |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉක්මවා තිබුණු ව්‍යාපාර 130 ක් පරිසර බලපත්‍ර ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාදීම සඳහා වැඩ පිළිවෙලක් යෙදවීමට කටයුතු කරන බව. | ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර පරිසර බලපත්‍ර ලබා ගැනීමට අදාල ආයතන දැනුවත් කළයුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී රු.9,500,000 ක් වියදම් කර ඉදිකරන ලද තඹුත්තේගම සතිපොල ගොඩනැගිලි පද්ධතිය සමාලෝචිත වර්ෂයේදී ද ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර තඹුත්තේගම නගර මධ්‍යයේ මාර්ගය අවහිරවන ලෙස ආවරණ ඉදිකරමින් බදාදා සතිපොල පැවැත්වීම සිදුකරමින් පැවතුණි. | 2023 ජුනි මාසයේ සිට සතිපොල ආරම්භ කිරීමට කටයුතු කරන බව. | අප්‍රමාදව සතිපොල අදාල ස්ථානයට රැගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එප්පාවල පුස්තකාලයේ අස්ථානගතවී ඇති බවට හඳුනාගෙන තිබුණු පොත් 124 ක් සම්බන්ධයෙන් වටිනාකම් ගණන් බලා වගකිව යුත්තන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ පවත්වා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |